# පැරණි වැදි ගෝත්‍රික සමාජ සැලැස්ම හා
# පරිසරය

දඹානේ ගුණවර්ධන

ලංකාවේ වැදි ගෝත්‍රයට අයත් ජන කොටස් අද දක්වාම ජීවත් වන්නේ ය යන්න නොරහසකි. වැද්දෝ කවරහු ද? ඔවුහු පරිසරයේ හතුරෝ ද? මිතුරෝ ද? මේවා වර්තමාන යුගයේ විමසිලි ඇසින් බැලිය යුතු ප්‍රශ්නයන් ය. අදට ඉතා සුළු පිරිසක් වශයෙන් ගම්මාන කීපයකට සීමා වී ඇති වැදි ජන කොටස අරුම පුදුම මිනිසුන් කොටසක් නොවේ. කවරම ශිෂ්ටාචාරයකට අයත් ජන සමාජයක් වුව ද අතීතයේ යම් යුගයක දී මෙම සමාජ මට්ටම ගතකොට ඇත. වෙනසකට ඇත්තේ අද දියුණු යැයි සම්මත ජනතාව එම අවදිය ඉතා ඈත කාලයක පසුකොට තිබීමත් වැදි ජනතාව වර්තමානයේ එම අවදියට අවතීර්ණය වී තිබීමත් පමණකි.

කෙසේ වෙතත් වැද්දා යන වචනයේ අරුතින් පවා පෙන්වා දෙන පරිදි ස්වභාවික වන ගහනය හා ඉතාමත් සමීප සම්බන්ධතාවයක් පවත්වා ගනිමින් කැලෑව සිය නිජබිම කරගත් වැද්දන් අතින් ගහකොළ සතුන් විනාශවී යන්නට ඇද්ද? දැනට පවතින වන විනාශයට වගකිව යුත්තෝ වැද්දන් ද? මෙය කවරෙකුට වුවද මතුවිය හැකි ගැටලුවකි. මෙම ගැටලුවට විසඳුම් සෙවීම සඳහා කළ යුතු කටයුත්ත වන්නේ ආදී වැදි ගෝත්‍රිකයන්ගේ සමාජ සැකැස්ම හා ආකල්ප සම්බන්ධව විමසුම් ඇසින් ගවේෂණයක යෙදීමයි.

මිහිතලයේ යම් අයෙක් සම්පත් පරිහරණය කරන විට ඒවා ක්ෂය වීම ස්වභාවයෙන්ම සිදු වන්නකි. නමුත් මෑතක් වන තුරුම ලෝකයේ පැරණි ජන සමාජයන් පාරිසරික සම්පත් පරිහරණය කරන ලද්දේ මනා සැලැස්මකින් යුතුවය. පරිහරණය කිරීමෙන් ක්ෂය වන සම්පත් නැවත ඒ තුළින්ම වර්ධනය වීමට කාලය හා ඉඩකඩ සලසා දීම තුළින් කාලාන්තරයක් තිස්සේ වුවත් නැවත නැවත එම සම්පත් උපදින ආකාරයට චක්‍රීය පිළිවෙලක් අනුගමනය කළ නිසා මෑතක් වන තුරුම මිනිසාට පාරිසරික ගැටලුවලට මුහුණ දීමට සිදු නොවී ය. විද්‍යාවේ දියුණුවත් ජන සංඛ්‍යාව විශාල වශයෙන් වැඩිවීමත් බෙදාහදා ගැනීම වැනි මානව ගුණධර්ම පිරිහී යාමත් වැනි හේතු නිසා ඉතා කෙටි කලකින් අතිවිශාල ප්‍රමාණයෙන් සම්පත් පරිහරණයට ගැනීම හේතුවෙන් සම්පත් නැවත වර්ධනය වීමට කාලය හා ඉඩප්‍රස්ථාව නොමැති වීමෙන් සම්පත් නිශ්චිත වශයෙන් ම විනාශවීම හේතුවෙන් අද ලෝකයේ පවතින අති විශාලතම ගැටලුව බවට පාරිසරික ගැටලුව පත්වූවා පමනක් නොව මිහිමත මිනිසා ඇතුලු ජීවීන් සහමුලින් අවසන් වීමේ මාර්ගය ද දියුණු මිනිසා අතින්ම සිදු කර ගැනීමක් බවට ද පත්වී තිබේ.

වැදි සමාජ සැකැස්ම විමසා බැලුව ද ඒ පැරණි ක්‍රමානුකූල සැලැස්ම පිළිබඳ ලක්ෂණය හඳුනාගත හැකිය. පැරණිතම වැදි ගෝත්‍රිකයන් දඩයම පමණක් සිය ජීවන වෘත්තිය කර ගනිමින් සංචාරක ජීවිතයක් ගත කළහ. ඊට සුදුසු පරිදි සත්ව ගහනයක් හා වන ගහනයක් පැවැතීමත් ජන සංඛ්‍යාව ඉතා කුඩා වීමත් නිසා එය බොහෝ කලක් තිස්සේ පවත්වාගෙන යාමට අවහිරයක් නොවීය. මෙම යුගය පිළිබඳව සැබෑ තොරතුරු සොයා ගැනීම අතිශයින් දුෂ්කරය. පසු කාලයක වැදි ගෝත්‍රිකයන් දෙබිඩි ජීවිතයකට හුරු වූහ. මෙම යුගය වැදි පරපුරේ මෑත පරම්පරා දෙක තුනෙන් ආරම්භ වූ නිසා ඒ පිළිබඳ සත්‍ය තොරතුරු සපයා ගැනීම අපහසු නොවේ. දෙබිඩි ජීවිතයන් ගතකළ වකවානුවේ අවුරුද්දේ මාස කීපයක් දඩයමින් ද අනෙක් මාස හේන් වගාවෙන් ද ජීවත් වූ හ. මානසික වශයෙන් හා ගෝත්‍රික වශයෙන් අතීතයේ පැවති තත්ත්වයට වඩා ක්‍රමානුකූල බවක් දක්නට ලැබෙන්නේ මෙම කාල සීමාවෙන් පසුව ය. නියඟ මාසවලට කඳු ප්‍රදේශවලින් තැනි බිමට එන වැද්දෝ එතරම් ඝනට නොවැඩුණු වන තීරයක හේන් වගා කරති. එහි ඇට සිටුවා දඬුවැට දමා ආරක්ෂා කොට නැවත කඳු ප්‍රදේශවලට ගොස් සුපුරුදු දඩයම් පැණි සෙවීම්වල නිරත වෙති. ආපසු වගා බිම් කරා එන්නේ අස්වනු නෙලන කාලය වන විට ය. නෙලා ගත් අස්වනු පරිහරණය කරමින් අලුතින් තවත් වගා බිමක් සකසන ඔවුහු පෙරසේම කඳු ප්‍රදේශවලට යති.

මෙසේ හේන් වගා කිරීම තුළින් වනය විනාශ වන්නට ඇතැයි ද දඩයම තුළින් සතුන් විනාශ වන්නට ඇතැයි ද යමකුට සිතෙන්නට පුලුවන. නමුත් ඔවුන් අතින් විනාශ වූ සම්පත් නැවත වර්ධනයට තුඩුදෙන අයුරින් සැකසුනු ක්‍රමානුකූල සැලැස්මක් ඔවුන් අනුගමනය කොට ඇත.

හේන් වගාව සම්බන්ධයෙන් සලකා බැලුවහොත් පාරිසරික සමතුලිතතාවය පවත්වා ගැනීම සම්බන්ධයෙන් අනුගමනය කළ පිළිවෙත් රැසකි. ගෝත්‍රික නීතිරීති වශයෙන් මේවා බොහෝවිට හඳුන්වන්නට හැකි වුවත් ගෝත්‍රික සමාජය මේවා පිළිගනු ලැබුවේ හුදෙක් නීති රීති වශයෙන් නොව සමාජ සම්මතයන් හැටියටයි.

විශාල ගසින් යුත් පැරණි කැලෑ හෙළි කිරීම එකල සිදු නොකෙරින. කැලෑවේ සෑම තැනකම හේන් කැපීම ද සිදු නොවීය. ඒ සඳහා තෝරාගත් වෙනම බිම් කඩවල් වදින සේ ගලක් විසිකළ හැකි ප්‍රමාණයට වඩා හේන් කැපීමක් සිදු නොවීය. වත්මන් මිනුම් ක්‍රම අනුව සලකා බලන්නේ නම් අක්කර භාගයකට නොවැඩි ප්‍රමාණයක් යැයි සිතිය හැකිය. අවට්න් වනාන්තරයෙන් වට වී තිබීමත් හේන් වගා බිමේ වුවත් විශාල ගස් නොකපා ඉතිරිකොට තැබීමත් නිසා මෙම කුඩා වගා බිම් තීරය කිසි ලෙසකින් මුඩු බිමක් බවට පත් නොවේ. අතහැර ගිය පසුව නැවත පැළෑටි වර්ධනය වීමට හිතකර පරිසරයක් බවට පත්වේ.



කීපයක් තිබිණි. එක් බිම් කඩක හේන් වගා කොට අනෙක් වසරේ වෙනත් බිමකට යති. මේ ආකාරයෙන් වසර හත අටක් බිම් මාරු කරන විට නැවත මුලින් වගා කළ බිම හේන් කැපීමට සුදුසු මට්ටමට වර්ධනය වෙයි. මේ ආකාරයේ චක්‍රිය බිම් මාරු ක්‍රමය කැලෑව නොනැසී පවත්වා ගැනීමට ගත් වැදගත් පියවරකි.

අනෙක් වැදගත් කරුණ වන්නේ ඔවුන් එක යාවට හේන් කැපීම හෝ වාසය කිරීමට අකමැති වීමයි. ස්වකීය පාරිශුද්ධත්වය ජීවිතය තරම් වැදගත් යැයි සැලකූ ගෝත්‍රිකයන් තම වාස භූමිය සකසා ගත්තේ එක් අයෙකුගේ හේනක සිට හුවක දුරකිනි. මේ හේන් වගා බිම් දෙක අතර විශාල වන තීරයක් ඉතිරි වේ. බොහෝවිට මෙම ක්‍රමය පාරිශුද්ධත්වය ආරක්ෂා කර ගැනීම හා ඉතා කිට්ටු ඇසුරකට දැක්වූ අකමැත්ත නිසා අනුගමනය කරන ලද්දක් වුවත් වන ගහනයේ පැවැත්ම කෙරෙහි නම් එය ඉමහත් රුකුලක් විය. හේන් වගා බිමක ප්‍රමාණය ගැන බැලුවහොත් ඒවා ඉතා කුඩා විය. හේන මධ්‍යයේ තනනු ලබන පැලේ සිට හේන වටා දමා ඇති දඬු වැටට

හේන් වගාවේ දී විශේෂයෙන්ම කඳු පෙදෙස් තෝරා නොගැනීම ඇලි කඳුරු ආදියට අවම වශයෙන් හුවක දුරක වන තීරයක් වත් ඉතිරිකොට තැබීම යන කරුණු ඔවුන් පරිසරය පිළිබඳව දැක්වූ ආකල්පය කෙබඳු ද යන්න මනාව කියා පාන්නකි. මානසික අතින් එතරම් දියුණු නොවූ පිරිසක් වශයෙන් සලකා බැලුවහොත් එක් අතකින් ඇදහිය නොහැකි මට්ටමේ අනාගත දැක්මක් එම ක්‍රියාවන් තුළ ගැබ්ව තිබේ.

මී කැඩීම හා ගස් කැපීම සම්බන්ධයෙන් පැවති සම්ප්‍රදායයන් ද ඉතා වැදගත් ය. මීයක් හෝ බඹරයක් වෙනුවෙන් කිසිම විටෙක ගසක් මුලින් කැපීම නොකෙරින. ගසක් කපා ගත යුතු නම් එහි එල දරන කාලයේ එය නොකපයි. බොහෝවිට ගස මුලින් නොකපා ගසේ අත්තක් කපා ගැනීම සිරිත විය. සතුන් ආහාරයට ගන්නා ගෙඩි වර්ග බහුලව සෑදෙන ගස් කවර හේතුවක් නිසා හෝ කැපීම නොකරයි. එසේ සිදු කළ හොත් දඬුවම් කිරීමේ හැකියාව පවා නායකයා සතුව තිබිණි.


මී කැඩීම සඳහා සිදුරු කරන ලද බෙනය ඒ අයුරින්ම තබා ඒම වැද්දන්ගේ සිරිත නොවේ. ගස් කොට ගල් පතුරු ආදිය තබා නැවත මීයක් බැඳීමට සුදුසු ආකාරයට බෙනය සකස් කරයි. මීයක් දුටු පමණින්ම කැඩීම ද සිරිත නොවේ. මී මැස්සාගේ වර්ණය හැසිරීම ගමන් විලාශය ආදියෙන් මීයෙහි පැණි ඇද්ද නැද්ද යන්න විමසා බැලීමට හැකියාවක් ඇති වැද්දන් මී කඩන්නේ පැණි ඇතැයි හැඟුනහොත් පමණකි.



දඩයම සම්බන්ධයෙන් පැවති සම්ප්‍රදාය පිළිබඳ ව සලකා බලන විට එහි ද මනා සැලැස්මක් තිබුණු බව පෙනේ. සතුන් දඩයම් කරන විට ළදරු සතුන් හෝ ගැහැණු සතුන් මැරුවේ ඉතා කලාතුරකිනි. කිරි බොන සතකු, කිරි දෙන දෙනක් හෝ ගැබ්බර දෙනක් කිසි ලෙසකින්වත් මැරීම සිදු නොවූ තරම් ය. බොහෝ විට දඩයම් කෙරුනේ මනාව වැඩුණු පිරිමි සතෙක් පමණි. බොහෝවිට දඩයම සඳහා නිවසින් පිටවන විටම එදිනට දඩයම් කරන සතා කවරෙක් දැ යි තීරණය කිරීම බොහෝ දෙනකුගේ සිරිත විය. තමා ගිවිස ගත් සතා හැර වෙනත් සතෙකු කවර හේතුවක් නිසා හෝ මරන්නේ නැත. දිය බොන හෝ වල් කමින් සිටින සතකු මරනු ලබන්නේ ඒ කටයුත්ත හමාර වූවාට පසුව ය. මේ පිළිවෙත තුළ වුවත් ඇත්තේ සාධාරණ දැක්මක් යැයි සිතීමට ඉඩ තිබේ.

පසු කාලීනව හේන් යායවල් එසේත් නැත්නම් වැදි ගම් වශයෙන් සකස්වුනු සමාජය තුළ දඩයම සීමා කරන තවත් වැදගත් සම්ප්‍රදායයක් විය. සතකු දඩයම් කරගත් විට මුලු ගමේම සියල්ලන්ටම බෙදී යන පිළිවෙලක් එකල විය. මේ ක්‍රමය යටතේ ගමේ සියල්ලන්ටම සතකු බැගින් මැරීමට අවශ්‍යය නොවීය. එක් සතකු මැරීම ගමටම ප්‍රමාණවත් විය. දඩයම සීමා වීමට පමණක් නොව බෙදාහදා ගැනීම, සමගිය වැනි සාරධර්ම වර්ධනට වීමට ද මෙය ඉවහල් විය. ඒ ඒ අයට වෙන් කරන මස් කොටස් (පංගු) වලට අයත් විය යුතු වෙන වෙනම කොටස් පවා තිබිණි. ගම පාලනය කරන්නාට ගං කොට්ටහක්, ආවුද සකසා දෙන්නාට කම්මල් කොට්ටහක්, සතා මස් කරන්නාට කොට්ටහක් ආදී වශයෙන් ජීවිතයට හා දඩයමට සම්බන්ධ සියලු දෙනාටම පමණක් නොව ගමේ අසරණයකු වේ නම් ඔහුට පිං කොට්ටහ වශයෙන් පංගුවක් දීමට පවා හුරු වී සිටිය හ. කෙසේ වෙතත් මේ සියල්ල එක්කොට බැලූ විට ගමේ මස් පංගුවක් නොලැබෙන පවුලක් නැත.

මේ ආකාරයට වන ගහනය හා එකට ජීවත් වෙමින් එහි සම්පත් සුලු වශයෙන් ක්‍රමිකව පරිහරණය කරමින් ජීවත් වූ වැදි ගෝත්‍රිකයන්ගේ වන පියෙස පිටස්තර ආක්‍රමණයකින් තොරව තිබුනේ නම් තවත් වසර දහස් ගණනක් එලෙසින්ම පවත්වා ගැනීමට ඉඩකඩ තිබුණා නොවේ ද? මේ පිළිවෙත් පැරණි යැයි කියා කෞතුක වස්තු ලෙසින් පසෙකින් තබමු ද? නොඑසේ නම් මේවා ගුරුකොට තබා ගනිමින් අදට ඉතිරිව තිබෙන සීමිත සම්පත් ටික හෝ ආරක්‍ෂා කර ගනිමින් ජන සමාජයත් පරිසරයත් රැක ගන්නා නව ක්‍රමයක් දියුණු යැයි සම්මත මිනිස් ප්‍රජාවට සකසා ගත නොහැකි ද? මේ වත්මන් ජන සමාජයේ ජීවත්වන ඔබ අප සියලු දෙනාම අවංක හදවතකින් විමසා බැලිය යුතු පැනයයි.





1993 ආදිවාසීන්ගේ වසරයි. ඒ ඒ රටවල ආදිවාසීන්ගේ සුභසාධනය කෙරෙහි විශේෂ සැලකිල්ලක් දැක්වීම මේ වසරේ දී අපේක්ෂා කෙරේ. පාරිසරික හා පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යාංශය පසුගියදා ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාවේ අනුග්‍රහයෙන් දඹානේ දී ශ්‍රී ලංකාවේ වැදි ජනතාව ගැන සජීවි ගුවන් විදුලි වැඩ සටහනක් විසුරුවා හරින ලදී.